

අනුරාධපුරයේ ජේතවනාරාමය

## යථාර්ථය දකින යෝනිසෝ මනසිකාරය

*– පොතුහැර විපස්සි හිමි*

බුදුදහමේ දැක්වෙන නුවණින් විමසීමේ පිළිවෙත පිළිබඳ විමසුමකි. චතුරාර්ය සත්‍ය පිළිබඳ පුද්ගලයා තුළ පහළ වන දැකීමට අනුව ගිය අවධානයකින් ජීවිතයේ අත්දැකීම් පිළිබඳ විමසීම – පුද්ගලයා තුළ විමුක්තියට යොමුකරවන කුසලය වර්ධනය කරන බවයි, මෙම ලිපියෙන් දැක්වෙන ප්‍රධාන අදහස වන්නේ.

## මාතෘත්වය හා පීතෘත්වය බුදුසමය අගයන අයුරු

*– නිර්මලා අමරසිංහ*

මවු පදවියට හා පිය පදවියට බුදුරදුන් පිරිනමා ඇති තැන. මවකගේ හා පියකුගේ සමාජමය වටිනාකම සහ ප්‍රගතිශීලී සමාජයක් බිහි වීම සඳහා මවු පිය – දූ දරු යහපත් සබඳතා ගොඩනැගීමේ අවශ්‍යතාව. රුහුණු විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය හිමිකර ගත් ලේඛිකාවක් මෙම ලිපිය සපයයි.

## බෞද්ධ චාරිත්‍ර ධර්ම පිළිබඳ දර්ශනික හා ආගමික පදනම

*– එච්. එස්. කුරේ*

බුදුදහම නිසා සමාජය තුළ මුල් බැසගත් විවිධ චාරිත්‍ර – චාරිත්‍රවල දර්ශනික අර්ථ සහ ඒවායේ ආගමික හා සමාජීක වටිනාකම් පිළිබඳ විමර්ශනයකි. ලේඛකයා හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.

## ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය හා බුදුදහම

*– ඩබ්ලිව්. කේ. උපසේන*

ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජවාදය ආදී වූ සමාජ පාලන න්‍යාය සහ බුද්දහමේ ඉගැන්වීම් අතර සම – විසමතා පිළිබඳ විමර්ශනයකි.

## කතුවැකිය

## Dialogues on Dhamma

*-By Bogoda Premaratne and Kumar de Silva*

## Role of religion

*- By Ven. (Dr.) M. Vajiranana*

## රූපවාහිනිය, බෞද්ධකම හා මවුපියන්ගේ වගකීම

*– ආචාර්ය සිරිපාල මාදුවගේ*

සදචාරවත් සමාජයක් ගොඩනැගීම සඳහා ප්‍රබල මාධ්‍යයක් වූ රූපවාහිනියට පැවරෙන වගකීම. අනාගත පරපුර දූෂිත මනෝභාවයන්ගෙන් මුදවාගෙන ඔවුන් තුළ බුද්ධිමත් ජීවන දැක්මක් ඇතිකිරීම සඳහා මවුපියන් සහ මාධ්‍යවේදීන් වෙත පැවරෙන යුතුකම.

## සදහම් දැනුම

*– වහුමුවේ විජයවංස නා හිමි*

බුදුදහම සහ ඊට අදාළ විවිධ විෂය කරුණු පිළිබඳ පාඨකයා දැනුවත් කරන විශේෂාංගයකි. කෙටි ප්‍රශ්න සහ පිළිතුරු ඇතුළත් මෙම විශේෂාංගය දහම හදාරන සිසුන්ට විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකිය.

## අවියේ නොව සවිය ඇත්තේ සාමයේ: බුදුහිමි ලොවට දුන් පණිවිඩය එයයි

*– එම්. ජී. පියසේන*

සාමකාමී සමාජයක් බිහිකිරීමට ඉවහල් වන බෞද්ධ ඉගැන්වීම්. මිනිසුන් අතර සාමය කඩවීමට බලපාන මනෝභාව පිළිබඳ විග්‍රහයක් ද – ඒ තත්ත්වය පිටුදැකීම සඳහා මනුෂ්‍යයන් වෙත ලබාදිය යුතු ජීවන අවබෝධය පිළිබඳ "විග්‍රහයක් ද" මෙම ලිපියට ඇතුළත් ය.

## ඇතුගල කන්ද ආරණ්‍ය සේනාසනය

*– ජනක වෙත්තසිංහ*

රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ඇතුගල සුප්‍රකට රක්ෂිත වන මූකලාන තුළ පිහිටි ස්වභාවික සෞන්දර්යයෙන් සපිරි වන සෙනසුනක් පිළිබඳ තොරතුරු.

## "සාමකාමී සමාජයක් ගොඩනැංවීමට මහා සංඝරත්නයේ මඟපෙන්වීම අවශ්‍යයි"

රාමඤ්ඤ මහා නිකායේ හැටහතර වැනි උපසම්පදා පුණ්‍ය මහෝත්සවයේදී අගමැතිතුමා කළ කතාව.

## ආර්ය සංඝයා හඳුනාගනිමු

*– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි*

වර්තමානයේ වැඩ වෙසෙන මහා සංඝරත්නය වෙත විවිධ සාවද්‍ය විවේචන එල්ල කරන අයටයි, මෙම කුඩා අනුශාසනාව. නිවන් පිළිවෙත විශේෂයෙන් සපුරන සමාජ කොටසක් විෂයෙහි වැරැදි සමස්ත ප්‍රතිරූපයක් ගොඩනැගීමේ අයෝග්‍යතාවයි, මෙම ලිපියෙන් පැවසීමට උත්සාහ කර ඇත්තේ. ලේඛකයා සුප්‍රකට විචිත්‍ර ධර්ම දේශක හිමි නමකි.

## මානයෙන් දුගති මාවත පෑදේ

*–දිවියාගහ යසස්සි නා හිමි*

"සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්" විශේෂාංගය යටතේ ලියැවුණු කුඩා ලිපියකි. තමන් පිළිබඳ විවිධ මිනුම් දඬු ප්‍රතිරූපණය කිරීම නිසා සිතේ පහළ කරගන්නා අගතිගාමී හැඟීම්වලින් කටයුතු කිරීමේ අයෝග්‍යතාවයි මෙම ලිපියෙන් පෙන්වා දෙන්නේ. ප්‍රකට ධර්ම ලේඛක හිමිනමක් විසින් සපයන ලිපි පෙළක – තවත් එක් ලිපියකි.

## ඉඹුල්ගම රජමහා විහාරය

*– දුමින්ද කාරියවසම්*

හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හංවැල්ල ප්‍රදේශයට ආසන්නව පිහිටා ඇති ඉපැරණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු දැක්වෙන ලිපියකි. අඩි හැත්තෑපහක් පමණ උස හිටි බුදු පිළිමයක් ද මෙම විහාරස්ථානයේ ඉදිකොට ඇත.